ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு

**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2022 - 12 - 21

පැමිණිලි පාර්ශවය : ඩී.එම්. එදිරිසිංහ මයා,
නො. 92, යාය 20,
රන්න,නැගෙනහිර,
රන්න.

වගඋත්තර පාර්ශවයන් :

1. විදුහල්පති,
 හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලය,
වීරකැටිය.

2. සභාපති,
අභියාචනා හා විරෝධතා මණ්ඩලය,
 හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලය,
වීරකැටිය.

**පැමිණිලි අංකය : HRC/MT/25/21/V**

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් පහත කරුණු මත තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බවත් ඊට සහන සලසා දෙන ලෙසටත් ඉල්ලා සිට ඇත.

**පැමිණිල්ල :-**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2021, පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධව නිකුත් කර ඇති අංක 29/2019 හා 2019.07.11 දිනැති චක්‍රලේඛනයේ 'රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුව බලපාන ආයතනික කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්' යන ගණය යටතේ තම පුත්‍රයා වන ජී.ආර්.තිනුග දින්සස් හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා ඉල්ලුම් කරන ලද බවත්, ඊට අදාළ පැවති සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු 53 ක් ලැබ තෝරා ගැනීමේ තාවකාලික ලේඛනයට තම දරුවාගේ නම් ඇතුළත් නොවූ බවත්, ඒ හේතුවෙන් 2020.12.02 දින පැවැත්වූ විරෝධතා සහ අභියාචනා පරීක්ෂණයටද ඉදිරිපත් වුවද එමගින් ද සාධාරණයක් ඉටු නොවූ


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail — sechrcsl@gma

බවත් පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. තමා විසින් ඉල්ලුම් කළ ගණය යටතේම ඉල්ලුම් කර ඇති කැඳවීම් අංක D-13 එස්.ඒ.එස්. නිමාලි ද සිල්වා යන අයගේ දරුවා හට 'දුෂ්කර පාසල් සේවා කාලය' සඳහා ලැබෙන ලකුණු 25 හෝ ඉන් කොටසක් හිමි විය නොහැකිව තිබියදී චක්‍රලේඛනයේ උල්ලංඝණය කරමින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය එම අයදුම්කරු වෙත ලකුණු 25 ක් ලබා දී ඇති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එම ලකුණු ලබා දීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවය හේතුවෙන් තම දරුවා හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයට, ඇතුළත් කර ගැනීමට නොහැකි වී ඇති බැවින් ඒ සම්බන්ධයෙන් සොයා බලා සාධාරණයක් ඉටු කර දෙන ලෙසට පැමිණිල්ලෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2021.02.02 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල සම්බන්ධව ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරමින් 2021 වර්ෂය සඳහා හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලය වෙත දරුවන් ඇතුළත් කිරීම සඳහා, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති අංක 29/2019 චක්‍රලේඛනය පරිදි කටයුතු කරමින් අයදුම් පත් කැඳවූ බවත්, ඒ අනුව 'රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තන්ගේ දරුවන්' යන ගණය යටතේ අයදුම්පත් 41 ලැබී තිබූ අතර, ඉන් පාසලට ළමුන් 9 දෙනෙකු ඇතුළත් කර ගැනීමට චක්‍රලේඛනය පරිදි ප්‍රතිපාදන ඇති බවත් දක්වා ඇත.

පැමිණිලිකාර ඩී.එම් එදිරිසිංහ මිය ඉහත ගණය යටතේ ද තම දරුවා වෙනුවෙන් අයදුම්පතක් යොමු කොට තිබූ බවත්, ඊට අදාළව පැවති සම්මුඛ පරීක්ෂණයේදී ඇයට ලකුණු 53 ක් ලැබී තිබූ අතර, එකී ලකුණු පිළිගෙන අදාළ ලේඛන වල අත්සන් කොට ඇති නමුත්, ඩී.එම් එදිරිසිංහ මිය පසුව පැවති විරෝධතා අභියාචනා පරීක්ෂණය සඳහා ඉදිරිපත් වෙමින් මෙම ගණය යටතේම සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් වී ඇති වලස්මුල්ල කළාප කාර්යාලයේ සේවයේ නියුතු සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නිමාලි ද සිල්වා මහත්මිය වෙත ලකුණු 54 ක් ලබා දීම හා 29/2019 චක්‍රලේඛනයේ 6:4:11 යටතේ සඳහන් දුෂ්කර පාසල් සේවා කාලය සඳහා ලකුණු 25 ලබා දීම සම්බන්ධයෙන් විරුද්ධත්වය ප්‍රකාශ කළ බවත්, දුෂ්කර සේවා කාලයට අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සහතික කළ යුතු බවට ඉහත චක්‍රලේඛයේ සඳහන් වන බවත්, ඒ අනුව නිමාලි ද සිල්වා මහත්මියද වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සහතික කරන ලද ලිපියක් ඉදිරිපත් කරමින් ඊට හිමි ලකුණු ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාකච්ඡා කර මෙම ලකුණු ලබාදුන් බවත් දක්වා ඇත.

එහෙත් දිගින් දිගටම පැමිණිලිකාරිය දක්වන ලද විරෝධතා හේතුවෙන් අදාළ ලකුණු ලබා දීම නිවැරදි ද යන්න වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙතින් උපදෙස් ඉල්ලා ලිපියක් යොමුකළ

බවත්, එකී උපදෙස් ඉල්ලීම සඳහා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසැල්) ඩබ්.ඒ.එස්.ඩී කල්‍යාණි මහත්මිය විසින් අංක දප/අදෙ/ජාපා/03/01/2021/හ හා 2021.01.04 දිනැති ලිපිය මඟින් ලබා දුන් උපදෙස් ලිපිය වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් පාසල වෙත එවා තිබූ බවත් දක්වා ඇත.

එමඟින්ද නිමාලි සිල්වා මහත්මිය වෙත ලකුණු ලබාදීම නිවැරදි බව දැන්වීම හේතුවෙන් 2021 වසර සඳහා ළමුන් ඇතුළත් කර ගැනීමේ ස්ථිර ලේඛනය ප්‍රදර්ශනය කළ බවත් වගඋත්තර පාර්ශවය වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

ඩී.ඩී.එම් එදිරිසිංහ මිය විසින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල විමර්ශන සඳහා හ/වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පති විසින් 2021.02.02 දිනැතිව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති වාර්තාව හා පාර්ශව කැඳවා 2021.04.08 දින සිදුකරන ලද පරීක්ෂණයේදී ඉදිරිපත් වී ඇති කරුණු පාදක කරගෙන ඇත.

29/2019 හා 2019.05.26 දිනැති චක්‍රලේඛනයට අදාළව අධ්‍යාපන ලේකම් විසින් 2020.05.26 දිනැතිව 2021 වර්ෂයේ 'රජයේ පාසල් වලට පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුළත් කිරීම පිළිබඳ උපදෙස්' නමින් නිකුත් කර ඇති නිවේදනය පරිදි අදාළ විදුහල්පතිවරු සම්මුඛ පරීක්ෂණ පවත්වා පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගත යුතු වේ.

මෙම පැමිණිල්ල සලකා බැලීමේදී විසඳා ගත යුතු ගැටළුව වනුයේ, පාසල් දුෂ්කර සේවා කාලය සඳහා අයදුම්පත් අංක ඩී 13 යටතේ ඉල්ලුම් කර ඇති එස්.ඒ.එස් නිමාලි ද සිල්වා යන අයදුම්කාරියට ලකුණු 25 ක් ලබාදීම 2019.05.26 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේ 29/2009 චක්‍රලේඛනයට අනුව සිදුකර ඇතිද යන්න හා ඒ තුළින් පැමිණිලිකාරියගේ මූලික අයිතිවාසිකම් කඩවීමක් සිදුව ඇත්ද යන කාරණයයි.

මෙහිදී පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයේදී ලද ලකුණු පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ස්ථිර සේවා කාලය | - | 06 |
| දුෂ්කර සේවා කාලය | - | 25 |
| ලබා නොගත් නිවාඩු | - | 08 |
| ස්ථිර පදිංචියේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර | - | 04 |
| වර්තමාන සේවා ස්ථානයේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර | - | 10 |
| **එකතුව** | - | **53** |

පැමිණිලිකාරිය විසින් විරෝධතා ඉදිරිපත් කර ඇති නිමාලි ද සිල්වා මහත්මිය වෙනුවෙන් සම්මුඛ පරික්ෂණයේදී පහත පරිදි ලකුණු ලබා දී ඇත.

| | | |
|---|---|---|
| ස්ථිර සේවා කාලය | - | 14 |
| දුෂ්කර සේවා කාලය | - | 25 |
| ස්ථිර පදිංචියේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර | - | 10 |
| වර්තමාන සේවා ස්ථානයේ සිට ඉල්ලුම් කරන පාසලට ඇති දුර | - | 05 |
| **එකතුව** | - | 54 |

පැමිණිලිකරුගේ විරෝධතාවය වී ඇත්තේ, දුෂ්කර සේවා කාලය සඳහා D-13 යටතේ අයදුම්කර ඇති එස්.ඒ.එස් නිමාලි ද සිල්වා යන අයට ලකුණු 25 ලබාදීම නීත්‍යානුකූල නොවන බවට වේ.

2019.05.24 වන දින 29/2019 දිනැති පාසල්වල පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ 6.4 පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයක කාර්ය මණ්ඩලයට අයත් තැනැත්තෙකුගේ දරුවන් 5% ක් ඇතුළත් කරගැනීමට අවස්ථාව සලසා දී ඇත. ඒ අනුව වීරකැටිය ප්‍රාථමික පාසලට 2021 වසර සඳහා දරුවන් නව දෙනකු තෝරාගත යුතු වන බව නිරීක්ෂණය වේ.

මෙහිදී ලකුණු ලබාදීම සිදුකරනුයේ, (29/2019 චක්‍රලේඛයේ 6.4 අනුව)

1. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන රජයේ පාසල් අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයන්හි කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවකයෙකු ලෙස සේවා කාලය පූර්ණ වර්ෂයකට ලකුණු 01 බැගින් (උපරිම ලකුණු 20)

2. දුෂ්කර පාසල් සේවා කාලය (දුෂ්කර පාසල් සේවා කාලය අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කළ යුතුය) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අති දුෂ්කර හා දුෂ්කර පාසල් ලෙස නම් කරනු ලැබූ චක්‍රලේඛනය අනුව,

    (අ) දැනට දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම් දුෂ්කර සේවා කාලය (මෙම කාලය අවසන්ව තිබිය යුතුය) පූර්ණ වසරකට ලකුණු 05 බැගින් ලකුණු 25

    (ආ) දැනට දුෂ්කර පාසලක සේවයේ නොයෙදෙන නමුත් මීට පෙර දුෂ්කර සේවයේ යෙදුනේ නම් සේවා කාලය දුෂ්කර දීමනා ගෙවූ බ සනාථ කළ යුතුය. පූර්ණ වසරකට ලකුණු 3 බැගින් ලකුණු 15 (උපරිම ලකුණු 25)

පැමිණිලිකාරිය විසින් විරෝධතා ඉදිරිපත් කරනු ලබන වලස්මුල්ල කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නිමාලි ද සිල්වා මහත්මිය සම්මුඛ පරීක්ෂණ මණ්ඩය විසින් මෙකී චක්‍රලේඛනයේ 6.4 II (ආ) යටතේ ලකුණු 25 ක් ලබා දී ඇත.

ඇය වෙත මෙම ලකුණු ප්‍රධානය කිරිම සඳහා 2020.09.14 දිනැති හ/වමු/කඅ/සා/පා/ප්‍රකස/11 වලස්මුල්ල කලාප අධ්‍යක්ෂ ජන්න උපාලි වීරසේකර මහතාගේ ලිපිය උපයෝගී කරගත් බව වගඋත්තරකාර විදුහල්පතිවරයාගේ ස්ථාවරය වේ.

එකී ලිපියෙහි 'සේවය කරනු ලබන බවට සහතිකය' හිසින් යුතුව උක්ත නිධාරිනිය 2006.07.03 දින රාජ්‍ය සේවයේ මුල් පත්වීම ලබා වලස්මුල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ 2013.09.25 දින සිට මේ දක්වා සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ ලෙස සේවයේ යෙදී සිටින බව පෞද්ගලික ලිපි ගොනුව අනුව සහතික කරන බව දක්වා ඇත.

දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ පරිපාලන චක්‍රලේඛ 01/2017 අනුව වලස්මුල්ල කලාප කාර්යාලය දුෂ්කර කලාපයක් බව නම්කර ඇති බවත් එහි සඳහන් වේ. මෙම ලිපිය හා ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය සලකා බැලීමේදී එහි 6.4.1 අනුව නිමාලි ද සිල්වා යන අයට අධ්‍යාපනයට සෘජුවම බලපාන ආයතනයන්හි කාර්ය මණ්ඩලයට අයත් සේවකයෙකු ලෙස ලකුණු 20 ක් ප්‍රධානය කිරිමට හැකියාව ඇත.

නමුත් චක්‍රලේඛයේ 6.4.II (ආ) යටතේ 'දුෂ්කර පාසල් සේවා කාලය' යන්න තවදුරටත් 'දුෂ්කර පාසලක සේවයේ යෙදේ නම්' යන්න පැහැදිලිව සඳහන් වන බැවින් ඒ යටතේ පාසලක සේවයක් නොකරන තනතුරක් ලෙස සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරියක් සඳහා ලකුණු 25 ක් ලබාදීම සිදුකළ නොහැක.

එමෙන්ම 29/2019 චක්‍රලේඛනයේ 4.2 හි සඳහන් වන පරිදි 2020 ජූලි 15 ට ප්‍රථම පාසල් ප්‍රධානීන් වෙත ලැබෙන සේ ළමයාගේ උප්පැන්න සහතිකයේ පිටපත හා ඉල්ලුම් කරන ගණය යටතේ අදාළ වන සියළුම ලිපිලේඛන වල පිටපත් දිවුරුම් ප්‍රකාශයක් මඟින් සහතික කර අමුණා එවිය යුතු බවට දක්වා ඇති නමුත් නිමාලි ද සිල්වා මහත්මියට ලකුණු ලබාදීමට පාදක වූ වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ ලිපිය නිකුත් කර ඇත්තේ 2020.09.14 වන අතර එනම්, සම්මුඛ පරීක්ෂණය සිදුකළ 2020.09.15 දිනට පෙර වේ.

මේ අනුවද මෙම ලකුණු ලබාදීම 2021 වසර සඳහා 1 ශ්‍රේණියට දරුවන් ඇතුළත් කරගැනීම 2019/29 චක්‍රලේඛනය හා 2020.05.26 දිනැති නිවේදනයට පටහැනිව සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

නිමාලි ද සිල්වා මහත්මියට ලකුණු ලබාදීම පිළිබඳව විරෝධතා දැක්වීම නිසා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙතින් ඒ පිළිබඳ නිවැරදිතාවය පිළිබඳ උපදෙස් ලබාගෙන ඇතත්, අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනයක් සම්බන්ධයෙන් අර්ථ නිරූපන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) වෙතින් ඒ පිළිබඳ නිවැරදිභාවය පිළිබඳ උපදෙස් ලබාගෙන ඇතත්, අධ්‍යාපන ලේකම් විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනයක් සම්බන්ධයෙන් අර්ථ නිරූපන නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් ඉදිරිපත් කිරීම ගැටළු සහගත වේ.

**නිරීක්ෂණය :-**

29/2019 චක්‍රලේඛනයේ දුෂ්කර පාසල් සේවා කාලය සාවද්‍ය ලෙස අර්ථකතනය කර දුෂ්කර පාසලක සේවය නොකරන ලද අයෙකුට ලකුණු ලබා දීම සිදු කර ඇති බව හා අදාළ චක්‍රලේඛනය මඟින් 2021 වසර සඳහා පාසල් ළමුන් ඇතුළත්කරගැනීම සඳහා 2020 ජූලි 15 ට පෙර පාසල වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී අවශ්‍ය සියළු ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හා පසුව ඉදිරිපත් කර ඇති ලේඛන සඳහා ලකුණු ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

මේ අනුව සලකා බැලීමේදී, නිමාලි ද සිල්වා මහත්මිය වෙත අදාළ සම්මුඛ පරීක්ෂණයේදී චක්‍රලේඛනයට පටහැනිව ලකුණු ලබාදීම තුළින් පාසලට දරුවන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු මට්ටම ඉහල ගොස් ඇති බැවින් පැමිණිලිකාර ඩී.එම් එදිරිසිංහ මහත්මියගේ දරුවා වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයේ 1 ශ්‍රේණිය සඳහා ඇතුළත් කරගැනීමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මේ අනුව චක්‍රලේඛනයෙහි දක්වන, 4.2, 6.4, I හා II වගන්තිය ප්‍රකාරව උක්ත විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා විරෝධතා හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය කටයුතු කර නොමැති බව පෙනී යන අතර, එසේ කටයුතු නොකිරීම මඟින් එකී වගඋත්තර පාර්ශවයන් විසින් 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කර දී ඇති 'නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීමද, නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය' යන අයිතිය උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වන ව්‍යවස්ථාවට උල්ලංඝනය වී ඇති බැවින්, පැමිණිලිකරුගේ දරුවා වන ජී.ආර්. තිනුග දින්සස් දරුවා වීරකැටිය ප්‍රාථමික විද්‍යාලයේ නියමිත ශ්‍රේණියට (2021 වර්ෂයේ පළමු ශ්‍රේණියට) ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023.01.23 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. අධ්‍යක්ෂ (ජාතික පාසැල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

04. මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය, මාතර.

B/